**ශීර්ෂය 119 - බලශක්ති අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 119 - බලශක්ති අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව බලශක්ති අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2026 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 ජූලි 01 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, බලශක්ති අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව බලශක්ති අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව බලශක්ති අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 අප්‍රේල් 25 දිනැති අමප/23/0632/621/031 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ලිහිසිතෙල් කර්මාන්තය සඳහා වාර්ෂික ස්ථාවර ලියාපදිංචි ගාස්තුව වශයෙන් රු. 6,000,000 ක්ද, ඊට අමතරව වාර්ෂික විකුණුම් වටිනාකමින් සියයට 0.9ක වටිනාකමකි. එම ගණනය කල වටිනාකමින් වාර්ෂික ස්ථාවර ලියාපදිංචි ගාස්තුව අඩුකොට ඉතිරි මුදල විචල්‍ය ලියාපදිංචි ගාස්තුව ලෙස අයකළ යුතුය. බලපත්‍රලාභීන් සමඟ ඇතිකරගත් ගිවිසුමෙහි 3.5 වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභී ආයතන විසින් ආනයන සහ විකුණුම් වලට අදාල තොරතුරු, මාසිකව, අර්ධ වර්ෂය අවසන් වී දින 14ක් ඇතුළත සහ වාර්ෂික විගණනය කළ තොරතුරු මාස 06ක් ඉක්මවීමට පෙර අමාත්‍යාංශයට සහ මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. 2025 වර්ෂය තුළ වාර්ෂික බලපත්‍ර ලබාගත් ආයතන 35න් ආයතන 16ක් පමණක් ස්වතක්සේරුව මත විචල්‍ය ලියාපදිංචි ගාස්තු ගෙවා ඇතත්, ගිවිසුම් ප්‍රකාරව විචල්‍ය ලියාපදිංචි ගාස්තු නිවැරදිව හඳුනාගැනීමටකටයුතු කර නොතිබුණි. නියැදි විගණන පරීක්ෂණයට අනුව එක් සමාගමක් 2025 වර්ෂයේ කාර්තු වාර්තා වලට අනුව ලිහිසිතෙල් විකුණුම් ආදායම මත ලැබිය යුතු විචල්‍ය ලියාපදිංචි ගාස්තුව රු. 20,523,031 ක් එකතුකර ගැනීමට හෝ හිඟ ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂයන්හි මෙම විකුණුම් ආදායම් සම්බන්ධව මහජන උපයෝගීතා කොමිෂන් සභාව මගින් තොරතුරු රැස් කර ඇත. ඉදිරි කටයුතු සඳහා, නිවැරදි තොරතුරු රැස් කිරීමට නව ඩිජිටල් ක්‍රමවේදයක් කඩිනමින් හඳුන්වාදීමට අපේක්ෂිතය. | ගිවිසුම අනුව ලියාපදිංචි ගාස්තු හා විචල්‍ය ආදායම අදාල කාලසීමාව තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ආ) දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 වර්ෂයේ අමාත්‍යාංශයට සියයට 60ක හිමිකාරිත්වයක් සහිතව මුලික ප්‍රාග්ධනයද ඇතුළුව රු. මිලියන 300කට අධික වියදමක් | පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම සතු Toyota Crew වර්ගයේ වාහනයේ තක්සේරුව | ලැබිය යුතු වටිනාකම් අයකරගෙන මූල්‍ය ප්‍රකාශන සටහන |

| | | |
|---|---|---|
| දරා සීමා සහිත පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම පිහිටුවා එමගින් ඉවතලන ප්ලාස්ටික්/ පොලිතින් මගින් ඉන්ධන නිපදවීම ප්‍රදන අරමුණ වුවත් එය ඉටු නොවීම හේතුවෙන්, 2018 සැප්තැම්බර් 26 දින මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම ගිවිසුම අනුව නිමවුම්කරු විසින් අමාත්‍යාංශයට 2018 වර්ෂයේ සිට වසර 10කින් බේරුම් කළ යුතු ප්‍රතිෂ්ඨාව වූ රු. 82,019,500ක වටිනාකම ලැබියයුතු ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබු අතර අමාත්‍යාංශයට ලැබිය යුතු ප්‍රතිෂ්ඨාව ගණනයේදී රු. 1,250,000 කට තක්සේරු කරන ලද මෝටර් වාහනයේ වටිනාකම සැලකිල්ලට ගෙන නොතිබුණි. | රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉටු කළ නොහැකි බව අමාත්‍යාංශයට දැනුම් දී තිබුණි. ඒ වන විට අනෙකුත් තක්සේරු වටිනාකම් වන රුපියල් 82,019,500 KL/LM තක්සේරු වාර්තාව මගින් ලබාගෙන අදාළ මෙහෙයුම් හා නඩත්තු ගිවිසුම සකස් කර තිබුණි. පසුව ලංකා ඔටෝ මොබයිල් සමාගම වෙතින් එම වාහනයට අදාළ තක්සේරු වටිනාකම මිලියන 1.25 ක් විය. එම වටිනාකම ගිවිසුමේ සඳහන් නොවුව ද රජයේ වත්කමක් වශයෙන් එම සමාගම සතුව පවතී. එහි සම්පූර්ණ තක්සේරු වටිනාකම රු. මිලියන 83.269 කි. | මගින් හෙළිදරව් කළ යුතුය. |

(ඇ) අත්තිකාරම් ගිණුම් ශේෂ

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| බලශක්ති අමාත්‍යාංශය විසින් වසර දෙකක් සඳහා බදු පදනම මත ලබාගෙන තිබූ කම්කරු කොන්ග්‍රස් ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද රු. 2,130,000 ක අත්තිකාරම් ගෙවීම, වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතවීම හේතුවෙන් ගිණුම් කාලපරිච්ඡේදයෙන් ඔබ්බට ගෙවන ලද අත්තිකාරම් මුදල ජනරජ ගිණුමේ රජයට ඇති හිමිකම නිරූපණය කිරීම ගිණුම්ගතකර නොතිබුණි. | අමාත්‍යාංශය විසින් වසර දෙකක් සඳහා බදු පදනම මත ලබාගෙන තිබෙන කම්කරු කොන්ග්‍රස් ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද රු. 2,130,000 ක් වූ අත්තිකාරම් මුදල, 9188 - කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමට හා 9189 - කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුමට 2026 වර්ෂයේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම් සකස් කිරීමේදී ගෙවන ලද අත්තිකාරම් නිවැරදි ගිණුම් වල සටහන් කළ යුතුය. |

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනයට අනුව 2025 දෙසැම්බර් 31 දිනට හිඟ බලපත්‍ර ගාස්තු ඇතුළුව හිඟ ආදායම රු. 650,522,043 ක් විය. එම මුදල තුළ වර්ෂයකට වැඩි කාලයක සිට ලැබිය යුතු රු. 17,432,823ක්වූ අතර ඒ තුළ අයවිය යුතු රු.4,400,000ක තාර ලියාපදිංචි ගාස්තු ද ඇතුළත් වූ අතර මෙම තාර ලියාපදිංචි ගාස්තුව ලබා ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. තවද, ඉහත මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් දැනුම් දීමේ ලිපි පමණක් යවා ඇති අතර වෙනත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ වන විට අදාළ හිඟ ලියාපදිංචි ගාස්තු සහ හිඟ විචල්‍ය ගාස්තු සම්බන්ධයෙන් එම ආයතන දැනුවත් කරමින් මුදල් ගෙවන ලෙසට ලිපි යවා ඇත. 2026 ජූනි 30 දින වන විට ලිහිසිතෙල් හා සම්බන්ධ සියලුම ආයතන මඟින් අදාළ ගණනය කිරීම් වාර්තා ගෙන්වා ගැනීමටත්, ගණනය කිරීම් තහවුරු කර ගැනීම සඳහා සුදුසු කමිටුවක් පත් කර, එහි නිරවද්‍යතාව පරීක්ෂා කිරීමට අපේක්ෂා කරනු ලැබේ. එමෙන්ම නියාමන ආයතනයක් නොමැති පසුබිමක මෙම වාර්තා පරීක්ෂා කිරීම සඳහා ලිහිසිතෙල් ක්ෂේත්‍රයේ ප්‍රවීනයකුගේ/ උපදේශකයකුගේ සහයෝගය ලබාගැනීම දුෂ්කර වී ඇත. | හිඟ ආදායම් හඳුනා ගැනීම හා ඒවා නොලැබීමට හේතු පිළිබඳ සොයා බලා අයකර ගැනීමට කටයුතු කළයුතුය |

### 3.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෙළවරපිටිය වරාය දෙවන භූගත සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය සඳහා වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන ලෙස රු..මිලියන 7,000ක් වෙන්කරගෙන තිබුණද, පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන සහ මු.රෙ. 66/69 මාරු කිරීම් මඟින් පිළිවෙළින් රු. මිලියන 5,800ක් සහ රු. මිලියන 716.96ක් අඩු කිරීම හේතුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදන ලෙස රු. මිලියන 483.03ක් විය . එසේම මෙම ව්‍යාපෘතියට අදාල ණය ගිවිසුම 2025 දෙසැම්බර් 15 දින බලාත්මකව ඇතත් ව්‍යාපෘතිය අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මෙම වියදම සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | ව්‍යාපෘතිය සඳහා ණය සාකච්ඡා පැවැත්වූයේ 2024 නොවැම්බර් 08 දිනදීය. ඒ අනුව ව්‍යාපෘතියේ පළමු වසර සඳහා ප්‍රතිපාදන පුරෝකතනය කර 2025 වසර සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදි. 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමණාකරණ පනත බලපැවැත්වීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා නැවත මූල්‍ය ඇගයීමක් සිදු කිරීමට අවශ්‍ය වූ අතර, ණය ගිවිසුම අත්සන් කිරීම සඳහා කැබිනට් අනුමැතිය 2025 අගෝස්තු 04 ලැබී ඇත. කෙසේ වෙතත් මේ වන විට සිදු වූ ප්‍රමාදය නිසා 2025 වෙන් කල ප්‍රතිපාදන, පූර්ව ගෙවීම සඳහා වන සියයට 10ක් පරිදි අවම මට්ටමේ මුදලක් දක්වා සීමා කරන ලදි. කැබිනට් අනුමැතියෙන් අනතුරුව කොන්ත්‍රාත් | පෙර සූදානම් සැලසුම් (Pre Readiness Plan) සකස් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත්, භෞතික ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීමට අදාල නිසි අධීක්ෂණයක් පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රධානය සඳහා අභිප්‍රාය ලිපිය 2025 අගෝස්තු18 දින නිකුත් කර ගිවිසුම 2025නොවැම්බර 25 දින අත්සන් කරන ලදි. කෙසේ වෙතත් ණය ගිවිසුම බල පැවැත්වීම සිදු වූයේ 2026 ජනවාරි 26 දිනට ආසන්න දිනයකදී වීම හේතුවෙන් 2025 වර්ෂය තුල කිසිදු මුදලක් නිදහස් කර ගැනිමට නොහැකි විය. මෙම ප්‍රමාදය අමාත්‍යංශයේ පාලනයට පරිභාහිර කරුණු බව පෙන්වා දෙමි. | |
| (ආ) | New Habarana Kappalthurai Transmission Development Project CEATP **1** (AIIB) ව්‍යාපෘතියේ හඳුනාගත් කාර්යයන් සඳහා වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන ලෙස රු. 1,000,000ක් සහ සාම්පූර් කප්පල්තුරෙයි සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන ලෙස රු. 1,000,000ක් වෙන්කරගෙන තිබුණි. ව්‍යාපෘතිය සඳහා පූර්ව සැලසුම් හෝ ප්‍රසම්පාදනය සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය නොමැතිව ව්‍යාපෘති ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2025 අගෝස්තු ආරම්භ කර තිබුණද, විදේශ ණය සැපයුම්භාර ආයතන විසින් පාරිසරික හා සාමාජීය බලපෑම් තක්සේරුවක් සිදු කිරීමට **(AIIB)** නිර්දේශ කිරීම හේතුවෙන් ටෙන්ඩර් ප්‍රධානය කිරීමට නොහැකිවී තිබුණි. | විගණන නිරීක්ෂණයෙහි සඳහන් ප්‍රසම්පාදන ප්‍රමාදයන් PDMO **නිෂ්කාශනය**, **ණය අවදානම් තක්සේරු සහ** on-lending / subsidiary financing ක්‍රියාවලිය, අමාත්‍ය මණ්ඩල අනුමැති ක්‍රියාවලිය, AIIB මූල්‍ය හා ප්‍රසම්පාදන අවශ්‍යතා, Loan Agreement negotiation / loan effectiveness **ක්‍රියාවලිය**, AIIB **පාරිසරික හා සමාජ අනුමැතිය**, ESIA / ESMP **අවශ්‍යතා සහ තාක්ෂණික** සම්බන්ධීකරණ අවශ්‍යතා හේතුවෙන් ඇති වූ ක්‍රමවේදමය හා අනුකූලතා සම්බන්ධ ප්‍රමාදයන් ලෙස සැලකිය හැක. එබැවින්, මෙම ප්‍රමාදයන් ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් සිදුවූ ප්‍රමාදයන් නොවන අතර, අදාළ රාජ්‍ය සහ **AIIB** ක්‍රමවේදයන්ට අනුකූලව ව්‍යාපෘති ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍ය අනුමැති හා නිෂ්කාශන ක්‍රියාවලීන් සම්පූර්ණ කිරීම හේතුවෙන් සිදුවූ ප්‍රමාදයන් බව කාරුණිකව දන්වමි. | පෙර සූදානම් සැලසුමක් **(Pre Readiness Plan)** සකස් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශය කටයුතු කාලීනව සිදු කිරීමටත්, ව්‍යාපෘතිවල භෞතික ඉදි කිරීම්වලට අදාළ ගෙවීම් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාල නිසි අධීක්ෂණයක් පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය මඟින් බලශක්ති අංශයේ ප්‍රධාන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ධාරිතා සංවර්ධන වැඩසටහන යටතේ විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා අරමුදල් ලබාදී තිබුණි. කාර්ය මණ්ඩල පුහුණු සැලසුම් සකස් නොකිරීම හේතුවෙන් 2025 වර්ෂයේ පුහුණුවීම් සිදු නොකිරීම හේතුවෙන්, ප්‍රදාන ලෙස ලබාදී තිබූ | විදුලිබල ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයේ කටයුතු එම කාර්යාලයේ එවකට, එනම්, 2024 ඔක්තෝබර් 16 දින සිට 2025 ඔක්තෝබර් 16 දින දක්වා සහ 2025 ඔක්තෝබර් 27 දින සිට 2026 ජනවාරි 15 දින දක්වා කටයුතු කළ අධ්‍යක්ෂ ජනරාල් හා අමාත්‍යාංශ ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී. ඒ අනුව විදුලිබල | පුහුණු සැලසුම් සකස් කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු..600,000 ක ප්‍රතිපාදන මුදල සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය සඳහා වෙනම බාහිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කර නොමැත. ඒ අනුව මෙම ධාරිතා සංවර්ධන වැඩසටහන සඳහා වෙන් කර තිබූ අරමුදල් වියදම්වීමක් සිදු වී නොමැත. | |

**3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව බැරකම් හා බැදීම් ලෙස හඳුනාගතයුතු වියදම් වර්ග 05කට අදාල රු. 225,438ක් වූ බැරකම් සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගතකර නොතිබුණි. | ප්‍රමාද දෝෂ හේතුවෙන් ගිණුම් ගත කිරීමට නොහැකි වී ඇත. | බැරකම් නිවැරදිව හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශන වල ගිණුම් ගත කළ යුතුය. |

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය "ජාතික අවශ්‍යතා සපිරෙන පරිදි, අඩු වියදම් බලශක්තිය සඳහා ප්‍රවේශය වැඩි කරමින් ඉන්ධන ආනයනය කළමනාකරණය හා දේශීයව නව බලශක්ති ප්‍රභවයන් බලශක්ති මිශ්‍රණයට එකතු කිරීම සහ නියමිත නීති සහ අණපනත් වලට අනුකූලව බලශක්ති විෂයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමනය මඟින් පරිසර හිතකාමී තිරසර බලශක්ති සැපයුමක් තහවුරු කිරීම " බලශක්ති අංශයේ මෙහෙවර වන අතර ඒ අනුව අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යන් යටතේ බලශක්ති සම්පත් පාලනය නියාමනය සහ උපයෝජනය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කර නොතිබුණි. තවද, 2006 ජුනි 08 දිනැති අංක අමප/06/0858/217/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධි විධාන) පනතට බලශක්ති නියාමනය සහ බලශක්ති නියාමනය සම්බන්ධයෙන් නීති | නියාමන ආයතන සම්බන්ධ අංක 26/0398/825/026 හා 2026 පෙබරවාරි 25 දිනැතිව කැබිනට් පත්‍රිකාවක් මේ වන විට යොමු කර ඇත. ඒ සඳහා ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය. | අමාත්‍යාංශය විසින් ජාතික අවශ්‍යතාවයක් වන බලශක්ති අංශයේ නියාමන කාර්යයන් කාර්යක්ෂම කිරීම සඳහා ප්‍රතිපත්ති සහ නීති සකස් කිරීම සිදු කළ යුතුය. |

සම්පාදනයට අදාලව සංශෝධන පනවන ලෙස දන්වා තිබූ අතර, 2022 අංක 27 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධි විධාන) (සංශෝධන ) පනත සකස්කර තිබුණ ද, ඒ තුළ ද බලශක්ති නියාමනය සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීමක් සිදුකර නොතිබුණි.ඒ හේතුවෙන්, අඩු ගුණාත්මකභාවයෙන් හා අවධානම් සහිත ඉන්ධන හා ලිහිසි තෙල් වෙළඳපොළට පැමිණීම, අනිවාර්ය ජාතික ඉන්ධන තත්ත්ව ප්‍රමිතියක් නොමැති කම, පාරිභෝගික පැමිණිලි සහ ආරවුල් විසඳීමේ යාන්ත්‍රණය නිසි ආකාරව ක්‍රියාත්මක නොවීම, අගය එකතු කළ ඉන්ධන නිෂ්පාදන සහ කාර්යසාධන ආකලන සඳහා නියාමනයක් නොමැති කම, සේවා ගුණාත්මකභාවය, ඉන්ධන පිරවුම්හල්වල ඌණතාවයන් සහ ප්‍රමාණවත් ආරක්ෂක අධික්ෂණයක් නොමැති කම, පාරිභෝගිකයින්ට, පරිසරයට සහ ජාතික බලශක්ති ආරක්ෂාවට අවධානමක් ඇති කිරීම, ලිහිසිතෙල් වෙළඳපොළ දත්ත සහ තොරතුරු යාවත්කාලීන වී නොමැති බැවින්, ලිහිසිතෙල් කර්මාන්ත පාර්ශවකරුවන්ට ස්වාධීන වෙළඳපොළ තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම යන අවදානම් ඇතිවී තිබුණි.

## 4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2007 වර්ෂයේදී තෝරාගෙන තිබූ පුද්ගලික සමාගම මන්නාරම් ද්‍රෝණියේ එම් - 2(M-2) ගවේෂණ බිම් කොටසේ (SL 2007-01-001) ඛනිජතෙල් ගවේෂණයේදී 2011 වර්ෂයේදී සොයා ගත් ස්වාභාවික වායු නිධි සංවර්ධනය හා නිෂ්පාදන කටයුතු සඳහා සුදුසු ආයෝජකයෙකු අන්තර්ජාතික තරඟකාරී යෝජනා කැඳවීමේ ක්‍රියාවලියක් මඟින් තෝරා ගැනීමට විදේශීය උපදේශන සමාගමක් 2016 දෙසැම්බර් 14 දින පත් කර තිබුණි. උපදේශන සහය ලබා ගැනීමේ ගිවිසුම 2017 දෙසැම්බර් 13 දින අවසන්ව තිබුණි. එම කාර්ය සඳහා අමාත්‍යාංශය විසින් රු. 46,610,853ක (ඇ.ඩො. 300,000) වියදමක් දරා තිබුණි. ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් | ශ්‍රී ලංකාවට බටහිර දෙසින් පිහිටි මුහුදු සීමාවේ මන්නාරම් ද්‍රෝණියේ තෝරාගත් ප්‍රදේශයක් ඇතුළත් වන පරිදි බලපත්‍ර ලබාදීමේ වටයක් (licensing round) ආරම්භ කිරීමට ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය සැලසුම් කර තිබුණි. මේ සඳහා තෝරාගත් අලෙවිකරණ උපදේශකවරයා සමඟ එක්ව, කැපවූ වෙබ් අඩවියක් නිර්මාණයට සහ නීතිපති දෙපාර්තමේන්තු උපදෙස් මත ලේඛන සකස් කිරීමටත්, දැනට පවතින නඩු කටයුත්තකට අදාළව ගරු අධිකරණය විසින් නිකුත් කරන ලද තහනම් නියෝගයක් (stay order) | ස්වාභාවික වායු නිධි සංවර්ධනය හා නිෂ්පාදන ඉදිරි කටයුතු සිදු කිරීම සහ සුදුසු ආයෝජකයකු තෝරා ගැනීම සිදු කළ යුතු වේ. |

| | |
|---|---|
| සම්පත් ගවේෂණය, සංවර්ධනය, උකහා ගැනීම සහ කළමනාකරණය යන කාර්යයන් නියාමනය කිරීමේ පරමාර්ථ ඇතිව 2021 අංක 21 දරණ ඛනිජතෙල් සම්පත් පනතේ විධිවිධාන යටතේ 2021 ඔක්තෝබර් 08 වන දින ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය ස්ථාපිත කර තිබුණ ද සුදුසු ආයෝජකයෙකු සොයාගැනීමට මේ වාර්තාවේ දින වන විටත් නොහැකි වී තිබුණි. | හේතුවෙන් සහ තහනම් නියෝගය ඉවත් කල පසු එම තීන්දුවට එරෙහිව අභියාචනයක් ගොනු කර තිබීමෙන් බලපත්‍ර නිකුත් කිරීම, අලෙවිකරණය සහ සියලුම අනුබද්ධ කටයුතු අඩපණ වී තිබුණි. කෙසේ වෙතත්, බලපත්‍ර ලබාදීමේ වටය ඉදිරියට කරගෙන යාම සඳහා අධිකරණයෙන් අනුමැතිය ලබා ගැනීමට PDASL ආයතනය සැලසුම් කරයි. |

## 4.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදුලිබල සැපයුමේ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහයවීමේ ව්‍යාපෘතිය යටතේ කිලෝමීටර් 285ක දිගකින් යුත් කිලෝවෝල්ට් 33ක රැහැන් කුළුණු සහ කිලෝවෝල්ට් 33ක ගැන්ට්‍රි 13ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2019 ඔක්තෝබර් 28 දින රු. මිලියන 7,314.05 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණි. එම ව්‍යාපෘතිය ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද පැකේජ 04 යටතේ දින730 ක් ඇතුළත එනම් 2021 ඔක්තෝබර් 27 දින වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, 2026 මාර්තු 31 දක්වා අවස්ථා 06 කදී දින 1,731කින් කාලය දීර්ඝ කිරීම කර තිබුණද, 2025 දෙසැම්බර් 31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 89.02 සහ සියයට 73.76 ක් විය. ඒ අනුව, ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි. | කළමනාකරණය පිළිතුරු ඉදිරිපත්කර නොමැත. | කොන්ත්‍රාත් ක්‍රියාත්මක සැලසුමට (Contract Implementation Plan) අනුව කොන්ත්‍රාත් කාර්යයන් නිම කල යුතුය. |
| (ආ) | විදුලිබල පද්ධතිය සවිබල ගැන්වීමේ සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දෙන ලද ණය මුදල 2025 ජනවාරි 09 දින සිට බලාත්මක වුවද, ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පැකේජ 7න් කිසිදු පැකේජයක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘති කටයුතු සඳහා කිසිදු ගෙවීමක් නොකර 2025 වර්ෂය තුළදී එ.ජ ඩො 161,829 කට සමාන රු.49,045,534ක බැඳීම් ගාස්තු සහ පොළී ගාස්තු පමණක් එම ණය මුදලින් දරා තිබුණි. | 2025 ජනවාරි මාසයේදී ආසියානු සංවර්ධන බැංකුව සමඟ ණය ගිවිසුම් අත්සන් කරන ලද අතර 2025 මාර්තු මාසයේ සිට පැකේජ 1,2,4,5,6 හා 7 සඳහා ටෙන්ඩර් ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. 2025 වර්ෂයේදී පැකේජ 6ක් සඳහා ටෙන්ඩර් ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇතත් ටෙන්ඩර් ක්‍රියාවලියේදී අභියාචනා ඉදිරිපත්වීම හා | පෙර සූදානම් සැලැස්මකට (Pre Readiness Plan) අනුව ප්‍රසම්පාදනය හා එම ප්‍රසම්පාදන කාර්යයන් නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | නීතිමය ගැටළු ආදී කරුණු හේතුවෙන් එම වර්ෂය තුළ ටෙන්ඩර් ප්‍රදානය කිරීමට නොහැකි වී ඇත. එබැවින් අපේක්ෂිත වියදම් සිදු නොවුණි. නිළධාරී හිඟකම ද ටෙන්ඩර් ක්‍රියාවලියේ ප්‍රමාදයන්ට බලපා ඇත. | |
| (ඇ) හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (අදියර 1) යටතේ ක්‍රියාත්මක වූ මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතියේ ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 19,288 ක් වේ. ව්‍යාපෘති ණය ගිවිසුම අනුව 2014 වර්ෂයේ ආරම්භ කර 2019 සැප්තැම්බර් 30 දින අවසන් කිරීමට නියමිතව තිබුණද, නිසි සැලසුම් සකස් කිරීමක් හා නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකිරීම හේතුවෙන්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ඉල්ලීම මත ව්‍යාපෘතියේ ලොට් අංක 01 නැවත සැලසුම් කිරීමට සිදුවීමත්, ඒකදේශීය මත්ස්‍ය විශේෂයක් හමුවීම හේතුවෙන්, ඒ පිළිබඳ පරිසර අධ්‍යනයක් කිරීමට සිදුවීමත් නිසා ව්‍යාපෘති ආරම්භය සැලසුම් කල කාලයට වඩා වසර 03ක ප්‍රමාදයකින් වැඩ ආරම්භකර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට මොරොගොල්ල ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 91.6ක් සහ සියයට 70ක් වූ අතර ව්‍යාපෘති කාලය 2026 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. | 2024 දෙසැම්බර් මාසයෙන්, පෙර ණය ගිවිසුම අවසන් වූ අතර 2025-2026 සඳහා ඇ.ඩො.මිලියන 15ක ණය මුදලක් ලබා ගෙන ඇත. 2025 නොවැම්බර් 26 දින බලපෑ දිට්වා සුළි කුණාටුව මෙම ව්‍යාපෘතියට බෙහෙවින් බලපා ඇති අතර එමනිසා අවසන් කළයුතු කාලසීමාව නැවත දීර්ඝකර ඇත. කරුණු සමඟ එකඟ වේ. | කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමේ සැලසුමට අනුව කොන්ත්‍රාත් කාර්යයන් නිම කර තිබේදැයි සුපරීක්ෂණය හා සොයා බලා යුතුය. ව්‍යාපෘති කඩිනමින් නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

## 4.4 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.2.1 (උ) අනුව, ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින්, අදාල ප්‍රසම්පාදන අස්තිත්වයන්හි එක් එක් කොන්ත්‍රාත්තුව සැලසුම් කර ඇති පරිදි, සියලුම ප්‍රසම්පාද අස්තිත්වයන් විසින් ප්‍රදානය කරන ලද සහ ක්‍රියාත්මක කරන ලද සියලුම ප්‍රසම්පාදනයන් සම්බන්ධව එක් එක් සැපයුම්කරු/ කොන්ත්‍රාත්කරු/ සේවා සම්පාදකගේ නම සමඟ ප්‍රසම්පාදනයේ තථ්‍ය ප්‍රමාණය, තත්ත්වය, පිරිවැය මෙන්ම කාල ඉලක්කයන්ට අදාළ පරාමිතීන් | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කටයුතු සඳහා සකස් කළ යුතු වාර්ෂික සහ අර්ධ වාර්ෂික ප්‍රසම්පාදන අනුකූලතා වාර්තා මේ දක්වා ලබා දී නොමැති අතර ඉදිරියේ දී එම අනුකූලතා වාර්තා සකස් කර ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත යොමු කරන බවට මෙමඟින් දැනුම් දෙමි. | ප්‍රසම්පාදන කාර්යසාධන වාර්තාව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත කාර්තුමය වශයෙන් ලබාදීමට කටයුතු කළ යුතුය. |

සඳහන් කරමින් අදාළ ප්‍රසම්පාදන අස්තිත්වයන්හි සවිස්තරාත්මක වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම්වලට අනුව පිළියෙල කරන ලද ඒකාබද්ධ “ප්‍රසම්පාදන කාර්යසාධන වාර්තාව”, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත කාර්තුමය වශයෙන් ලබාදිය යුතු වුවද, , 2026 මාර්තු 30 දින වන විටත් බලශක්ති අමාත්‍යාංශය ඉහත මාර්ගෝපදේශය අනුව කටයුතු කර නොතිබුණි.

## 4.5 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් 2025 දෙසැම්බර්31 දිනට වාහන අනතුරු 09ක් සම්බන්ධව මු.රෙ. 104(4) ප්‍රකාරව රු. 1,999,373 ක අලාභ හානි අයකරගෙන නොතිබුණි. | අංක PC – 4318 දරන වාහනයේ අලාභය රියදුරු වෙතින් රු.260,828.57 ක් අයකර ගත යුතු අතර,<br>අංක HE – 2381 දරන වාහනය ලංකා විදුලිබල මණ්ඩලයට අයත් වාහනයක් වන අතර එම ආයතනය විසින් මෙම අනතුරට අදාළ අලාභය අය කර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී.<br>අංක 65 – 2067 දරන විදුලිබල මණ්ඩලයට අයත් වාහනය අමාත්‍යාංශය වෙත අනුයුක්ත කළ කාලය තුළ සිදු වූ අනතුරක් වන බැවින් මෙම අනතුර සම්බන්ධයෙන් කිසිඳු ලේඛනයක් ලංකා විදුලිබල මණ්ඩලය සතු නොවන බව නීතිපති දෙපාර්තමේන්තුව දන්වා ඇත. අලාභ තහවුරු කිරීමට ප්‍රමාණවත් ලේඛන ඉදිරිපත් කළහොත් නඩු පැවරීමේ හැකියාව පවතින බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත. අංක KF – 1999 හා අංක PF – 5094 දරන වාහන සඳහා නීතිපති උපදෙස් ඉල්ලා ඇත.<br>අංක PH – 1148 දරන වාහනය සඳහා අයකර ගැනීමට නියමිත මුදල හා අංක PH – 1150 දරන වාහනයේ අලාභ හානි අලුත්වැඩියා කර ගැනීම සඳහා වැය වූ රු.117,000ක මුදලට අදාළ බිල්පත නෛතික කටයුතු සඳහා නීතිපති වෙත යොමු කර ඇත. අංක KL – 9507 මේ සඳහා මුදලක් අයකර ගැනීමට ඇත. | පාඩු හා හානි සම්බන්ධ මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 4.6 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 අගෝස්තු 09 දිනැති අංක 2135/61 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත දැක්වේ. | ව | |
| (i) | ජාතික මෙහෙයුම් කමිටුවක් මඟින් අදාළ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා අදාළ කමිටුව කාර්තුමය පරාසයන් තුළ රැස්වී ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අමාත්‍ය මණ්ඩලයට වාර්තා කිරීම සිදුකර නොතිබුණි. | සමස්ත බලශක්ති ක්ෂේත්‍රයම අධ්‍යානයකර නව බලශක්ති ප්‍රතිපත්තියක් සෑදීම සඳහා 2024 අංක 36 දරණ ජාතික විදුලිබල පණතෙහි (2025 අංක 14 මඟින් සංශෝධිත) ඇතුළත් ප්‍රතිපාදන ප්‍රකාරව විදුලි බල අංශය සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත.<br>බලශක්ති අංශය සඳහා සුදුසු ක්‍රමවේදයක් මේ වන විට සකස් කරමින් පවතී. එය 2027 **ජනවාරි** 01 දින සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. | ජාතික මෙහෙයුම් කමිටුව කාර්තුමය රැස්වී සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | බලශක්ති ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි 04 වන ඡේදය ප්‍රකාරව, කාර්යසාධන කාලරාමුව සෑම වසර දෙකකට වරක්ම (එම වගකීම පවරා ඇති ආයතන විසින්) සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වුවත්, 2019 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වසර 06ක් ගතව ඇතත් අදාළ කාර්යසාධන කාලරාමුව සංශෝධනයට කටයුතු කර නොමැති අතර, අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කර නොතිබුණි. | සමස්ත බලශක්ති ක්ෂේත්‍රයම අධ්‍යානයකර නව බලශක්ති ප්‍රතිපත්තියක් සෑදීම සඳහා 2024 අංක 36 දරණ ජාතික විදුලිබල පණතෙහි (2025 අංක 14 මඟින් සංශෝධිත) ඇතුළත් ප්‍රතිපාදන ප්‍රකාරව විදුලිබල අංශය සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත. බලශක්ති අංශය සඳහා සුදුසු ක්‍රමවේදයක් මේ වන විට සකස් කරමින් පවතී. එය 2027 **ජනවාරි** 01 දින සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. | කාර්යය සාධන කාල රාමුව විගණන අවශ්‍යතා අනුව සංශෝධන ඉදිරිපත් කළ යුතුය. |
| (iii) | බලශක්ති ප්‍රතිපත්තියේ කාර්යසාධන කාලරාමුව තුළ බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම යටතේ 4.1.d ඡේදය අනුව බලශක්ති ක්ෂේත්‍රයේ කාර්යසාධනය කෙරෙහි තීරණාත්මක බලපෑම් එල්ල කළ හැකි අභ්‍යන්තර හා බාහිර අවිනිශ්චිතතාවයන් පිළිබඳ අවධානම් ඇගයීමේ මණ්ඩලය පත්කර තිබුණද, එම මණ්ඩලය අවධානම් ඇගයීමේ කටයුතු සිදුකර නොතිබුණි. | සමස්ත බලශක්ති ක්ෂේත්‍රයම අධ්‍යානයකර නව බලශක්ති ප්‍රතිපත්තියක් සෑදීම සඳහා විදුලිබල අංශයසඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත.<br>බලශක්ති අංශය සඳහා සුදුසු ක්‍රමවේදයක් මේ වන විට සකස් කරමින් පවතී. එය 2027 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. | බලශක්ති ක්ෂේත්‍රයේ කාර්යය සාධනය කෙරෙහිතීරණාත්මක බලපෑම් එල්ල කළ හැකි අභ්‍යන්තර හා බාහිර අවිනිෂ්චිතතාවයන් පිළිබඳව අවධානම් තක්සේරුවක් සිදු කර ඒ පිළිබඳව ඇගයීමක් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ තනතුරක් සඳහා අවිධිමත් ලෙස වැඩ බැලීමේ පත්වීමක් ලබාදී වසර 07ක් සඳහා වැටුප් වශයෙන් රු. 2,000,000 ක් ගෙවා තිබුණි. | ඉදිරි කටයුතු සඳහා, නිවැරදි තොරතුරු රැස් කිරීමට නව ඩිජිටල් ක්‍රමවේදයක් කඩිනමින් හඳුන්වාදීමට අපේක්ෂිතය. | විධිමත් අනුමැතියකින් වැඩ බැලීමේ පත්කිරීම් සිදුකළ යුතු අතර එසේ නොමැති නම් අදාල මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |